ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ශිෂ්‍ය විනය නීති

## 1 කොටස - සාමාන්‍ය ශිෂ්‍ය විනය
## විෂමාචාර හා විනය විරෝධී ක්‍රියා

1. සෑම ශිෂ්‍යයෙක්ම මනා පැවැත්මෙන් යුක්ත විය යුතු අතර ශිෂ්‍යභාවය තිබෙන තුරු උපාධි අපේක්ෂකයකුගේ තත්වයට සරිලන පරිදි විනීත ලෙස හැසිරිය යුතුය.

2. සියළුම ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය සෑහීමට පත්වන ආකාරයෙන් ස්වකීය අධ්‍යයන කටයුතු වල නිරත විය යුතුය. විධිමත් පරිදි ලබාගත් අවසරයකින් තොරව හෝ සාධාරණ හේතු රහිතව කිසියම් ශිෂ්‍යයෙකු එක් අධ්‍යයන වර්ෂයක් තුළ සති තුනකට වැඩි කාලයක් දේශන හා ප්‍රායෝගික පංතිවලට සහභාගී වීමෙන් වැළකී නොසිටිය යුතුය.

3. කිසිම ශිෂ්‍යයෙකු විෂමාචාර හෝ විනය විරෝධී ක්‍රියා වශයෙන් සැලකෙන පහත සඳහන් වැරදි ක්‍රියානොකළ යුතුය.

3.1 විශ්වවිද්‍යාලයේ හොඳ නමට අහිතකර හෝ හානිකර වන අයුරින් හෝ අධ්‍යාපන කටයුතු වලට විභාග කටයුතු වලට හෝ පරිපාලන කටයුතු වලට හෝ විශ්වවිද්‍යාලයේ නිත්‍යානුකූල ක්‍රියාකාරීත්වයට බාධා වන අයුරින් හෝ එකී අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වල නිලධාරියෙකුට හෝ සේවකයෙකුට ඔහුගේ රාජකාරි කටයුතුවල යෙදීමට අවහිර හෝ බාධා වන අයුරින් හෝ අපහාසයක් හෝ නින්දාවක් වන අයුරින් හෝ ක්‍රියා කිරීම.

3.2 තමා වෙත නිකුත් කරනු ලැබූ ශිෂ්‍ය වාර්ථා පොත උපකුලපති හෝ විශ්වවිද්‍යාලයේ ආචාර්ය හෝ පරිපාලන නිලධාරියෙකුට හෝ උපකුලපති/ ලේඛකාධිකාරි විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු හෝ ඉල්ලා සිටි විට ඉදිරිපත් නොකිරීම, ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, පැහැර හැරීම හෝ අනන්‍යතාවය තහවුරු නොකිරීම.

3.3 විශ්වවිද්‍යාලයේ දේපල වලට අලාභහානි කිරීම, එම දේපල විශ්වවිද්‍යාලයෙන් පිටතට ගෙනයාම, තමා සතුකර ගැනීම හෝ අත්සතු කිරීම, විශ්වවිද්‍යාල භූමිය, ගොඩනැගිලි, තාප්ප, පාරවල් ආදිය සීරීමෙන්, ලිවීමෙන්, ඇඳීමෙන්, කඩදාසි, පෝස්ටර් ඇලවීම ආදියෙන් අපිරිසිදු කිරීම, විකෘති කිරීම හා අශෝභන කිරීම.

3.4විශ්වවිද්‍යාලයේ වෙනත් ශිෂ්‍යයෙකුගේ,ආචාර්යවරයකුගේ, නිලධාරියෙකුගේ හෝ සේවකයකුගේ හෝ විශ්වවිද්‍යාලයට නීත්‍යානුකූලව හා නිසි පරිදි පැමිණෙන ආගන්තුකයකුගේ ස්වාධීනත්වයට, පෞද්ගලිකත්වයට බාධාවක් හෝ හානියක් වන අන්දමින් ක්‍රියා කිරීම, ඒ අයට අලාභහානි කිරීම, අවඥාවට ලක් කිරීම, අවධානමට පත් කිරීම හෝ මානසික හෝ ශාරීරික පීඩාවට පත් කිරීම ආදී ක්‍රියාවක නිරත වීම හෝ එවැනි ක්‍රියාවකට අන් අයෙකු පෙළඹවීම, කුපිත කරවීම හෝ එවැනි ක්‍රියාවකට ආධාර කිරීම හෝ අනුබල දීම.

3.5 1985 අංක 7 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් සංශෝධනය වූ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ iii කොටසේ 112 , 114 ,115, 116, 117 හා 118 වගන්තිය හා ඒ හා කියැවෙන අනු වගන්ති මගින් සලසා ඇති විධිවිධාන වලින් සංගමයක් වශයෙන් ලියා පදිංචි වූ සමිති, සමාජ හා සංගමයන් හැර වෙනත් කිසිම සංවිධානයක්, සමිතියක්, සමාජයක් විශ්වවිද්‍යාලය ඇතුලත ආරම්භ කිරීම, සංවිධානය කිරීම, පවත්වාගත යාම හා එවැනි සංවිධානයක කටයුතු වලට සහභාගි වීම හෝ එවැනි සංවිධානවලට ආධාර දීම හෝ අනුබල දීම.

3.6 ඉහත (5) යටතේ දක්වා ඇති පරිදි ලියා පදිංචි කළ සමිතියක්, සමාගමක්, සමාජයක් විසින් පූර්ව අනුමැතිය ඇතිව සංවිධානය කළ රැස්වීමක්, සම්මන්ත්‍රණයක්, උත්සවයක්, පෙරහැරක්, ප්‍රදර්ශණයක්, විවාදප්‍රසංගයක්, නාට්‍යයක්, චිත්‍රපටියක්

හෝ ආගමික සංස්කෘතික හෝ සමාජීය වෙනත් උත්සවයක් ව්‍යාපාරයක් කඩාකප්පල් කිරීම ඒවා පැවැත්වීමට බාධා වන පරිදි හැසිරීම කෑකෝ ගැසීම හෝ වෙනත් ක්‍රියාවන් කිරීම හෝ අනවසරයෙන් ඇතුළු වීම ඒවාට සහභාගි වන අයට බාධා කිරීම හා හිංසා කිරීම.

3.7 විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අනුමැතිය ඇති විශ්වවිද්‍යාලයේ පරිපාලන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් හෝ බාහිර සංවිධානයන් විසින් සංවිධානය කල රැස්වීමක්, උත්සවයක් , ප්‍රදර්ශනයක්, දේශණයක්, සම්මන්ත්‍රණයක් හෝ ආගමික සංස්කෘතික හෝ සමාජීය උත්සවයක්, ව්‍යාපාරයක් කඩාකප්පල් කිරීම ඒවා පැවැත්වීමට බාධාවන පරිදි හැසිරීම කෑකෝ ගැසීම හෝ වෙනත් ක්‍රියාවන් කිරීම හෝ අනවසරයෙන් ඇතුළු වීම හා ඒවාට සහභාගි වන අයට බාධා කිරීම හා හිංසා කිරීම.

3.8 උපකුලපතිගේ ලිඛිත පූර්ව අනුමැතිය නොමැතිව විශ්වවිද්‍යාලය තුල හෝ පරිශ්‍රය ඇතුලත රැස්වීමක් පෙරහැරක් උත්සවයක් ප්‍රදර්ශනයක් සම්මන්ත්‍රණයක් නාට්‍යයක් චිත්‍රපට ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම හෝ පැවැත්වීම හෝ එවැනි කටයුත්තකට ආධාර දීම, අනුබල දීම සහභාගී වීම හෝ එවැනි කටයුත්තකට විශ්වවිද්‍යාලයට සම්බන්ධ නැති බාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගැනීම හෝ විශ්වවිද්‍යාලයට කැඳවීම.

3.9 විශ්වවිද්‍යාල ආචාරයවරයෙකු, නිලධාරියෙකු හෝ සේවකයෙකු හා සම්බන්ධ වූ හෝ විශ්වවිද්‍යාලයෙන් බාහිර කුමන ප්‍රශ්නයක් ගැන හෝ පක්ෂව හෝ විපක්ෂව රැස්වීම පැවැත් වීම, පිටමං කිරීම, උද්ඝෝෂණය කිරීම, පෙලපාලි යාම, සටන්පාඨ කීම, සත්‍යග්‍රහ, සත්‍යක්‍රියා, උපවාස ,පාදයාත්‍රා අදියට සහභාගි වීම, වෙනත් අය සහභාගි කරවීම, උනන්දු කරවීම, අනුබල දීම, ආධාර දීම, කුමන ප්‍රශ්ණයක් ගැන හෝ පෝස්ටර්, අත්ලිපි දැන්වීම් පල කිරීම, ඇලවීම, බෙදීම, ඇදීම, ලිවීම.

3.10 කුමන ආකාරයක හෝ නවක වදය දීම (සැ.යු. නවක වදය දී අසුවුවහොත් කිසිදු පරීක්ෂණයකින් තොරව විශ්වවිද්‍යාලයෙන් නෙරපිය හැකි බැව් සැලකුව මැනවි )

3.11 උපකුලපතිගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා නොගෙන යම්කිසි සමිතියක හෝ සංගමයක නිලයක් දරණ හෝ නොදරණ ශිෂ්‍යයෙකු විසින් විශ්වවිද්‍යාලයේ සිසුන්ගෙන් මුදල් සම්මාදම් කිරීම, වෙනත් ද්‍රව්‍යයන් එකතු කිරීම, එසේ සම්මාදම්වලට හෝ එකතු කිරීමට අනුබල දීම, හෝ එකතු කළ කිසිවක් ලග තබා ගැනීම හෝ බෙදා දීම.

3.12 විශ්වවිද්‍යාලයේ හොඳ නමට, විනයට හෝ සාමයට අහිතකර හෝ හානිකරවන හෝ විශ්වවිද්‍යාලයට සම්බන්ධ කිසිම තැනැත්තෙකුට අපහාස හෝ නිගාවන අන්දමේ කිසිම දැන්වීමක්, පෝස්ටරයක්, විස්තර පත්‍රිකාවක්, ලියවිල්ලක් හෝ වෙනත් ප්‍රකාශනයක් විශ්වවිද්‍යාලය තුළ හෝ ඒ අවට ලිවීම, ඇලවීම, බෙදා හැරීම, ප්‍රර්ශනය කිරීම, ප්‍රකාශනයට පත් කිරීම, මුද්‍රණය කිරීම සහ/ හෝ බෙදා හැරීම.

3.13 1985 අංක 7 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් සංශෝධනය වූ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 115 වන වගන්තිය යටතේ පිහිටුවා ගනු ලැබූ සමිතියක, සමාජයක හෝ සංගමයක කටයුතු වලට අදාල වූ උපකුලපතිගේ හෝ අදාල ආචාර්යවරයාගේ හෝ ප්‍රධාන ශිෂ්‍ය උපදේශකගේ හෝ අනුමැතිය ලබාගත් දැන්වීමක් වුවද ඒවා ප්‍රදර්ශනය කළ හැකි, ලිවිය හැකි හෝ ඇලවිය හැකි වන සේ වෙන්කර ඇති තැන්වල හැර වෙනත් ස්ථානයක පළකිරීම ,ඇලවීම, ප්‍රදර්ශනය කිරීම, ලිවීම හෝ ඇඳීම.

3.14 ශිෂ්‍යයෙකු තමා වෙනුවෙන් හෝ වෙනත් ශිෂ්‍යයෙකු හෝ වෙනත් ශිෂ්‍ය කණ්ඩායමක් වෙනුවෙන් හෝ සමිතියක හෝ සංගමයක හෝ නියෝජිතයෙකු වශයෙන් සිටිමින් විශ්වවිද්‍යාලයේ හොඳ නමට කැලලක් වන්නා වූ හෝ විශ්වවිද්‍යාලයේ බල මණ්ඩල

වලට නින්දාවක් හෝ අපහාසයක් වන්නා වූ හෝ හානිකර වන්නා වූ විශ්වවිද්‍යාලයේ සේවය කරන හෝ ඊට සම්බන්ධ කිසිදු ආචාර්ය වරයෙකුට නිලධාරියෙකුට හෝ සේවකයෙකුට අපහාස වන අන්දමේ යම් ප්‍රකාශයක් හෝ ලිපියක් දැන්වීමක් පුවත්පතක හෝ වෙනත් ජනමාධ්‍යයක් මගින් ප්‍රකාශයට පත්කිරීම පළකිරීම හෝ එවැනි ජනමාධ්‍යයකට තිකුත් කිරීම.

3.15 විශ්වවිද්‍යාලය තුලට මත්පැන් මත්ද්‍රව්‍ය ගෙන ඒම ඒවා බෙදා හැරීම, අලෙවි කිරීම හෝ ලගතබා ගැනීම හා මත්පැන්, මත්ද්‍රව්‍ය විශ්වවිද්‍යාලය තුල පාවිච්චි කිරීම හෝ එබදු ක්‍රියාවකට වෙනත් අයකු පෙලඹවීම, අනුබල දීම හෝ ආධාර දීම හෝ මත්පැන්, මත්ද්‍රව්‍ය පාවිච්චි කර විශ්වවිද්‍යාලය තුළ රැදී සිටීම.

3.16 විශ්වවිද්‍යාලය තුලට අවිආයුධ පුපුරන ද්‍රව්‍ය හෝ කෙනෙකුට තුවාලයක්, හිංසාවක්, කැලලක් හෝ හානියක් කළහැකි ආයුධයක් හෝ ද්‍රව්‍යයන් ගෙන ඒම ලග තබා ගැනීම හෝ එවැනි කාර්යයකට අනුබල දීම.

3.17 විශ්වවිද්‍යාලය විසින් ඉල්ලා සිටින හෝ ශිෂ්‍යයෙකු වශයෙන් විශ්වවිද්‍යාලයට සැපයිය යුතු තොරතුරු විස්තර ආදිය නොසැපයීම හෝ සැපයීම පැහැර හැරීම හෝ අසත්‍ය හෝ විකෘති කල තොරතුරු සැපයීම.

3.18 විශ්වවිද්‍යාල ගොඩනැගිලි, ශාලා, භූමිය, උපකරණ, භාණ්ඩ හා වෙනත් ද්‍රව්‍ය අනියම් ලෙස අයථා ලෙස හා ඒවායේ නියමිත හෝ සම්මත හෝ ඒවා වෙත් කරන ලද කාර්යයන්ට හැර වෙනත් කාර්යයක් සඳහා හෝ ඒවායේ භාවිතය සඳහා ඇති නීති රීති උල්ලංඝණය කරමින් භාවිතා කිරීම හෝ ඒවා යොදවා ගැනීම.

3.19 ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල භූමිය තුල නේවාසික පහසුකම් නොසපයන නිසා විශ්වවිද්‍යාල භූමිය හා ගොඩනැගිලි වසා තබන වේලාවන් තුල විශ්වවිද්‍යාල භූමිය තුල හෝ ගොඩනැගිලි තුල රැදී සිටීම. (කලින් කළ වසන වේලාවන් වෙනස් විය හැකිය.)

3.20 ශ්‍රී ලංකා ජනරජයේ අපරාධ නීති සංග්‍රහයේ කිසියම් නීතියක් යටතේ උසාවියකින් වරදකරු යයි තීන්දු කරන ලද ශිෂ්‍යයෙකුගේ එම තීනදුව පදනම් වූ වරද හෝ අපරාධය.

## <u>ii කොටස - දඬුවම්</u>

1. විනය විරෝධී හා විෂමාචාර ක්‍රියා හා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් යම් විශ්විද්‍යාලයක ශිෂ්‍යයෙකු වරදකරුවෙකු වුවහොත් මෙහි පහත සඳහන් දඬුවම් අතුරින් එක් දඬුවමක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විනය මණ්ඩලයේ නිගමනය හා නිර්දේශය සලකා උපකුලපතිතුමා විසින් පැනවිය හැකිය.

1. අනතුරු ඇගවීම හෝ තදින් අවවාද කිරීම
2. රුපියල් 100 ට නොවැඩි දඩයක් නියම කිරීම
3. විශ්වවිද්‍යාලයට අලාභයක් සිදු වී ඇත්නම් එම අලාභය අයකර ගැනීම.
4. විශ්විද්‍යාල භූමියට පැමිණීම හා /හෝ පංති වලට හා පරීක්ෂණ වලට සහභාගි වීම යම් කාල සීමාවට තහනම් කිරීම.
5. නිශ්චිත කාලසීමාවන් තුළ විශ්වවිද්‍යාල විභාග වලට පෙනී සිටීම අත්හිටු වීම.
6. නිශ්චිත කාල සීමාවක් සඳහා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අත්හිටුවීම කල් දැමීම හෝ විභාග ප්‍රථිඵල හෝ සහතික නිකුත් කිරීම අත්හිටුවීම හෝ අවලංගු කිරීම.
7. විශ්වවිද්‍යාලය හා / හෝ පාඨමාලාව හැරගියා සේ සැලකීම.
8. විශ්වවිද්‍යාලයෙන් නෙරපීම.

(ඉහත සඳහන් යම් දඬුවමක් හෝ දඬුවම් අවස්ථාවට උචිත පරිදි අත්හිට වූ දඬුවම් වශයෙන් ක්‍රියාත්මක කළ හැකිය. නවක වදය වෙනුවෙන් දෙන දඬුවම් විශ්වවිද්‍යාලයෙන් නෙරපීම බැව් සලකන්න.)

2. කිසියම් ශිෂ්‍යයෙකුගේ හැසිරීම, ක්‍රියාකලාපය හෝ ක්‍රියාවන් නිසා විශ්වවිද්‍යාලයේ විනය හා සාමය ආරක්ෂා කිරීමට විශ්වවිද්‍යාලයේ පැවැත්මට හා ක්‍රියාකාරිත්වයට අපහසුවක් හෝ බාධාවක් හෝ විය හැකියයි උපකුලපතිතුමාට හැඟී ගියහොත් කිසිදු පරීක්ෂණයකින් තොරව හෝ කිසිවෙකුගේ නිර්දේශයක් නොමැතිව වහාම ක්‍රියාත්මක වන පරිදි ඉහත අංක 1 - 8 යටතේ දක්වා ඇති කවර හෝ දඬුවමක් දිය හැකි ය.

3. ඉහත අංක 1 යටතේ දක්වා ඇති දඬුවම් අතරින් යම් දඬුවමක් හෝ දඬුවම් නියම කරනු ලැබූ යම් ශිෂ්‍යයෙක් එම දඬුවම හෝ දඬුවම් නියම කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් වේ නම් ඔහුට එම දඬුවම දැනුම් දී දින 14 ක් ඇතුළත එයට විරුද්ධව උපකුලපති වෙත අභියාචනයක් කළ හැකිය.

4. උපකුලපති වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය ගැන පාලක සභාවේ උපදෙස් පරිදි උපකුලපති දෙන තීරණය අවසාන තීරණය වේ.

5. 1 වන කොටසේ දක්වා ඇති විනය නීති කඩ කිරීම, විෂමාචාර හැසිරීම ආදී චෝදනා වලට වැරදි කරුවන් වන ශිෂ්‍යයින්ට ඉහත අංක 1 යටතේ දක්වා ඇති දඬුවම් වලට අමතරව උපාධිය හෝ අභිඥාණ පත්‍රය හෝ සහතික පත්‍ර හෝ ශාස්ත්‍රීය සහ වෙනත් විශිෂ්ඨතා පිරිනැමීමට පෙරාතුව එම ශිෂ්‍යයාගේ ශිෂ්‍ය කාලය තුළ ඔහුගේ ක්‍රියා කලාපය සම්බන්ධව සලකා බැලීමට හා ඇගයීමට විශ්වවිද්‍යාලයට බලය ඇත.

## iii කොටස - අර්ථකතනය:

1. මෙහි "විශ්වවිද්‍යාලය" යනුවෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හඳුන්වයි.

2. "ශිෂ්‍යයා" යනුවෙන් විධිමත් පරිදි ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ලේඛණාරූඪ වී යම් පාඨමාලාවක් හදාරන ශිෂ්‍යයෙකු, ශිෂ්‍යාවක හෝ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමින් හැඳින්වේ.

3. "දේපල " යනුවෙන් විශ්වවිද්‍යාල ගොඩනැගිලි, දේශණශාලා, පුස්තකාල, නේවාසිකාගාර ගෘහභාණ්ඩ උපකරණ, වාහන හා විශ්වවිද්‍යාලයට අයත් වෙනත් සියළු නිශ්චල හා චංචල දේපල අයත් ය.

4. "ඔහු" යන්නෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය හැඳින්වේ.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන වචනයක් හෝ වචන කාණ්ඩයක් හෝ වාක්‍යයක් ගැන පාලක සභාව දෙන අර්ථකතනය අවසාන අර්ථකතනය වෙයි.

6. "පාලක" සභාව යනුවෙන් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ.